# කථානායකවරයා ඉන්දියාවේදී බාරොන් ජයතිලක ශ්‍රීමතාණන්ගේ චිත්‍රයක් නිරාවණය කරයි



ඉන්දු ශ්‍රී ලංකා මෑතකාලීන රාජ්‍යතාන්ත්‍රික සබඳතාවයේ අසූ වසර සනිටුහන් කරමින් ඉන්දියාවේ ප්‍රථම ශ්‍රී ලංකා මහ කොමසාරිස් ශ්‍රීමත් බාරොන් ජයතිලක මැතිතුමාගේ ආලේඛ්‍ය චිත්‍රයක් නවදිල්ලියේ පිහිටි මහ කොමසාරිස් කාර්යාල ප්‍රධාන ගොඩනැගිල්ලේ නිරාවරණය කෙරිණි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් මෙම චිත්‍රය නිරාවරණය කරන ලද අතර ආලේඛ්‍ය චිත්‍රය නිරාවරණය කිරීම වෙනුවෙන් සංවිධානය කර තිබූ චාම් උත්සවයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සී.බී. රත්නායක, රෝහිණී කුමාරි විජේරත්න සහ පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක යන මහත්ම මහත්මීහු සහභාගි වූහ. කථානායකවරයා ප්‍රමුඛ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු දූත පිරිස ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගි වී ආපසු ශ්‍රී ලංකාවට එන අතරවාරයේදී දිල්ලි නුවරදී මෙම උත්සවයට සහභාගී වූ අතර ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා ඇතුළු මහ කොමසාරිස් කාර්යාලයේ කාර්ය මණ්ඩලය මෙම අවස්ථාවට එක්ව සිටියහ.